# සුරේන්ද්‍ර වෙද පරපුරෙහි සර්ප විෂ ප්‍රතිකාර

පාරම්පරික වෛද්‍ය ඩබ්ලිව්. ජී. සුමනදාස

මොරවක වැලිව ප්‍රදේශයෙහි සර්ප විෂ වෙදකම සඳහා ප්‍රසිද්ධියක් උසුලන අප වෙද පරපුර මව් පාර්ශ්වයෙන් පැවත එන්නකි. සර්ප විෂ වෙදකමට අමතර ව කැඩුම් බිඳුම් වෙදකම ද අප විසින් කරනු ලැබේ.

සර්ප දෂ්ටනයක් සිදුවීමෙන් අනතුරු ව රෝගියා පැමිණි පසු රෝග ලක්‍ෂණ අනුව හෝ දූත ලක්‍ෂණ අනුව දෂ්ට කරන ලද සර්පයා හඳුනා ගැනීමේ හැකියාව අප හට පවතී.

ප්‍රතිකාර යෙදීමේ දී පළමු ව දෂ්ට ස්ථානය දෙහි කැබැල්ලක් ඇතිල්ලීමෙන් පිරිසිදු කර දෙවනු ව නයි ගල භාවිත කර විෂ ඉවත් කිරීම සිදුකරනු ලැබේ. වීදුරු බෝතලයක් භාවිත කිරීමෙන් , ඉඟිනි ඇටය මගින් හා කිකිළියගේ අධෝ මාර්ගය භාවිතයෙන් ද විෂ ඉවත් කිරීමට හැකි වුව ද දැනට මෙම ක්‍රම අප පරම්පරාවෙහි අභාවිතය. නයි ගල තබා විෂ ඉවත් කිරීමෙන් පසු මන්ත්‍ර මතුරනු ලැබේ. එමගින් රෝගියාගේ දෝෂ සමනය මෙන් ම රෝගියාගේ මානසික සුවපත්භාවය ද බලාපොරොත්තු වේ.

ඉන්පසු රෝගියාට තැම්බුම් වේදුවක් අල්ලනු ලැබේ. එය "වක්කම් ඇල්ලීම" නමින් ද හැඳින්වේ. ඉන්පසු දෂ්ට ස්ථානය සඳහා ආලේප බෙහෙත් යොදනු ලැබේ. රෝගියා කෙරෙහි ඉදිමුම, ඇස් ඇඳිරිය, මුත්‍රා දැවිල්ල, ඇඟෙහි බර බව, කැසීම හා අසාත්මිකතා වැනි උපද්‍රව පහළ වූ විට ඒවා සඳහා ද ප්‍රතිකාර යොදනු ලැබේ. විශේෂයෙන් ම අභ්‍යන්තරික ව යොදන ඖෂධ මෙන් ම බාහිර ව යොදන ඖෂධ ද යොදා ගනු ලැබේ. ඉදිමුම් සඳහා ආලේප බෙහෙත් ද ඇස් ඇඳිරිය සඳහා ඉස කුඩිච්චි දැමීම ද කරනු ලැබේ. මීට අමතර ව ප්‍රතිකාර සඳහා කෙම් ක්‍රම ද භාවිත කරනු ලැබේ.

රෝගීන් සඳහා කැඳ වර්ග ද යොදා ගනු ලැබේ. විශේෂයෙන් ම කරපිංචා, පිටවක්කා, මුඩමහන, හීන්බෝවිටියා, මුකුණුවැන්න, සප්සඳ යනාදිය කැඳට යොදා ගනු ලැබේ. මෙම කැඳට එළඟිතෙල් දමන අතර ලුණු නොදමයි.

ප්‍රතිකාර යෙදීමේ දී රෝගියාගේ ආහාරපාන පිළිබඳ ව ද සැලකිලිමත් වේ. කැකුළු සහල් බත් හා එළවලු වර්ග ද, අඹවැංජන, ගොරකා , දෙහි , සියඹලා වැඩිපුර යොදා පිළියෙල කරන ලද වැංජන වර්ග රෝගියා සඳහා යෝග්‍ය වන අතර ආහාරවේල නිර්මාංශ විය යුතුය.

මෙලෙස ප්‍රතිකාර යෙදීමෙන් රෝගියා සම්පූර්ණයෙන් ම සුවපත් කළ හැකිය.